# සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම (LECO)

# රැකියා අවස්ථා (ඇබෑර්තු)

1500 ක සේවක බළකායක් සහිත සහ 500,000 කට වැඩි පාරිභෝගිකයින් සංඛ්‍යාවක් සඳහා සේවා පහසුකම් සලසන, මීගමුවේ සිට ගාල්ල දක්වා දිවයිනේ වෙරළ තීරයේ, මෙහෙයුම් ප්‍රදේශ ආවරණය කරන, ශාඛාවන් සතක් (07) සහිත විදුලිය බෙද හැරීමේ උපයෝගිතා ආයතනයක් වන සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම විසින් පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් අයවළුන් බඳවාගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

## 01. ගනුදෙනුකාර සේවා අධිකාරී

| | |
|---|---|
| **අධ්‍යාපන සුදුසුකම්** | (අ) ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) විදුලිබල හෝ<br>(ආ) විදුලි ඉංජිනේරු ශිල්පය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව හෝ<br>(ඇ) ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු) හෝ<br>(ඈ) ශ්‍රී ලංකාවේ විවෘත විශ්වවිද්‍යාලයේ, තාක්ෂණවේද ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු) හෝ<br>(ඉ) විදුලි ඉංජිනේරු ශිල්පය පිළිබඳ සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් උසස් ඩිප්ලෝමාව (ප්‍රායෝගික සහ සිද්ධාන්ත පිළිබඳ සම්පූර්ණ සහතිකය) |
| **රැකියාව පිළිබඳ දැනුම (පළපුරුද්ද)** | විදුලි බල බෙදහැරීමේ පද්ධති මෙහෙයුම හා නඩත්තුව පිළිබඳ තාක්ෂණ ශිල්පී නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද |
| **වෙනත් අවශ්‍යතාවන්** | ● පරිගණක සාක්ෂරතාව<br>● ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ක්‍රියාකාරී දැනුම |
| **වයස** | 2022 පෙබරවාරි 28 වන දිනට වයස අවුරුදු 50 ට අඩු විය යුතුය. |

පුළුල් ආන්තික ප්‍රතිලාභ පෙළක් සහිත ආකර්ෂණීය වැටුපක් තෝරාගනු ලබන අපේක්ෂකයා හට පිරිනැමේ.

කරුණාකර ඔබගේ විස්තරාත්මක ජීව දත්ත තොරතුරු ප්‍රකාශ (CV) සහිත අයදුම්පත්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින හා විමසුම් දුරකථන අංකද සමග පහත සඳහන් අය වෙත 2022 පෙබරවාරි 28 වන දිනට හෝ ඊට පෙර ලැබෙනසේ යොමු කරන්න.

අයදුම්කරනු ලබන තනතුර, ජීව දත්ත තොරතුරු ප්‍රකාශයේ (CV) හි සහ ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කරනු මැනවි.

**අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන)**
**සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,**
**1 වන මහල, ඊ.එච්. කූරේ ගොඩනැගිල්ල, 411, ගාලු පාර, කොළඹ 03.**